සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

## දෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2023
## Second Term Test - Grade 06 - 2023

## සිංහල භාෂාව හා සාහිත්‍යය

කාලය පැය 02 යි

නම / විභාග අංකය:

### I කොටස

- **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **අංක 1 සිට 5 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. සිංහල අක්ෂර මාලාවේ ඇති ස්වර අක්ෂර ගණන,
    i. 12කි. ii. 10කි. iii. 16කි. iv. 18කි.

02. අනුක්ත නාම පදය තෝරන්න.
    i. තොප ii. ළමයෙක් iii. මම iv. මවක්

03. මධ්‍යම පුරුෂ ඒක වචන ක්‍රියා පදයකි.
    i. කියමු ii. කියයි iii. කියති iv. කියහි

04. "ළමයා කතන්දර පොත ශබ්ද නගා කියෙව්වේ ය" යන වාක්‍යයේ කර්ම පදය කුමක් ද?
    i. ළමයා ii. පොත iii. කතන්දර iv. ශබ්ද නගා

05. "පාපිල්ල" පමණක් යෙදුණු වචනය තෝරන්න.
    i. පාලම ii. කිරි iii. පුරුදු iv. කැවුම්

- **අංක 6 සිට 8 තෙක් ප්‍රශ්නවල දී ඇති පදවල සමානාර්ථවත් පදය තිත් ඉර මත ලියන්න.**

06. තාරපති - ............................................................................

07. ධවල - ............................................................................

08. කත - ............................................................................

- **අංක 9 සිට 10 තෙක් ප්‍රශ්නවල දැක්වෙන වචනවලට විරුද්ධාර්ථවත් පදයක් බැගින් තිත් ඉර මත ලියන්න.**

09. දොම්නස - ............................................................................

10. ආදරය - ............................................................................

- **අංක 11 සිට 13 තෙක් ප්‍රශ්නවල වගන්තියට ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

11. මහාප්‍රාණ අක්ෂරයක් යෙදී නැති වචනය,
    i. ආරූඪ   ii. ගඟ   iii. ඡන්දය   iv. සංඝයා

12. සඤ්ඤක අක්ෂරයක් සහිත වචනය,
    i. ළමයා   ii. පීඨය   iii. හොඬය   iv. නුවණ

13. "පෝරුව" යන වචනය නිර්මාණය වීමට ස්වර ව්‍යඤ්ජන නිවැරදි ව යෙදුණු පිළිතුර,
    i. ප්+ඕ+ර්+ඌ+ව්+ආ   ii. ප්+ඖ+ර්+උ+ව්+ආ   iii. ප්+ඕ+ර්+උ+ව්+අ   iv. ප්+ඕ+ර්+ඇ+ව්+අ

- **අංක 14 සිට 15 තෙක් ප්‍රශ්නවල නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු වචනය තෝරන්න.**

14. i. ප්‍රතීඵලය   ii. මහළු මිනිසා   iii. පරීක්ෂණය   iv. විශේස

15. i. දර්ශනය   ii. දක්සින   iii. පෝශනය   iv. පරිඝනකය

- **අංක 16 සිට 19 තෙක් ප්‍රශ්නවල හිස්තැන්වලට ගැළපෙන පදය වරහන් තුළින් තෝරා ලියන්න.**

16. ........................................................ (ගුරුවරු/ගුරුවරුන්) සිසුන් අගය කළහ.

17. කාන්තාවක් අසරණ ........................................................ (ගැහැනියක්/ගැහැනියක) රැක බලා ගන්නී ය.

18. වෙළෙන්දිය බඩු හොරට කිරා ........................................................ (විකුණුවේ ය / විකිණුවා ය.)

19. කම්කරුවෝ විශාල ගස පාරෙන් ඉවත් ............................................ (කළේ ය. / කළෝ ය.)

20. පහත වාක්‍ය නිවැරදි ව පද බෙදා විරාම ලක්ෂණ යොදා නැවත තිත් ඉර මත ලියන්න.

අම්මේඅනික්පාරමමත්බෝට්ටුවෙන්යනවායිශරත්කෑගැසුවේය

..............................................................................................................................................................

..............................................................................................................................................................

..............................................................................................................................................................

(ලකුණු 2 × 20 = 40යි)

## II කොටස

- **ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.**
- **1, 2, 3 ප්‍රශ්න සඳහා අනිවාර්යයෙන්ම පිළිතුරු සැපයිය යුතු අතර, 4, 5, 6 ප්‍රශ්නවලින් තෝරාගත් ප්‍රශ්න දෙකකට පිළිතුරු ලියන්න.**

**01. පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

i. හල් කළ නොහැකි ව්‍යඤ්ජන අක්ෂර 2ක් ලියන්න.

ii. පහත සඳහන් කවිය සම්පූර්ණ කරන්න.

කැමට කෑදරකම් නොකරන්නේ
තව මට කියමින් කෑ නොගසන්නේ

..........................................................................................

..........................................................................................

iii. අතීත කාල ඒක වචන ස්ත්‍රී ලිංග ක්‍රියාපද දෙකක් ලියන්න.

iv. "ස්වාමිනී අපි ඉඳිකටු කුළා නිසා බට දඬු ගෙන්වූම්හ"
ඉහත උද්ධෘතය උපුටා ගත් පාඩමේ නම ලියන්න.

v. "දැන් උල්පතේ හැටි කොහොම ද කියා බලමු"
මෙම ප්‍රකාශය කළේ කවුද? කාටද?

(ලකුණු 2 × 5 = 10)

**02. පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 150කට නොඅඩු රචනයක් ලියන්න.**

i. හොඳ සිරිත් අගයමු.

ii. ජල සම්පත් සුරකිමු.

iii. නිරෝගී දිවියට ආහාරවල වැදගත්කම

iv. උදෑසන අසිරිය

v. මුහුදු වෙරළක සැඳෑවක් (ලකුණු 20)

**03. පහත අවස්ථා අතරින් එකකට පිළිතුරු සපයන්න.**

ලෝක ගුරු දිනය වෙනුවෙන් තම පන්තිභාර ගුරුතුමියට යවන සුබ පැතුම් පත නිර්මාණය කරන්න.

නැතහොත්

ඔබ පාසලෙන් අස් වී ගිය ඔබේ හොඳම මිතුරාගේ තොරතුරු සුවදුක් විමසා බලමින් යවන ලිපියක් ලියන්න.

(ලකුණු 10)

**04. පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.**

අදට ද කලා වැවට නුවර කලාපීය වැසියෝ ගරු බුහුමන් දක්වති. ලංකාවේ විශිෂ්ටතම වාන පිහිටා ඇත්තේ කලා වැවේ ය. මෙය කළුගල කපා සාදා ඇත. මේ වාන මෑත කාලයන් හි ප්‍රතිසංස්කරණයෙහි දී පවා එසේ ම තිබෙන්නට ඉඩ හැර ඇත. මෙය අඩි 216ක් පළල අඩි 170ක් දිගු එකකි. මෙය එකල නිර්මාණය කෙරුණු පුදුමාකාර නිර්මාණයකි. එකල සිටි ශිල්පියාගේ ඉවසිලිවන්තකමත් දක්ෂ බවත් මින් පිළිබිඹු කෙරේ. විසල් වැවක තවත් වැදගත් අංගයක් ලෙස රළපනාව හඳුන්වා දිය හැකි ය. මෙය, දිය රැලි වැවේ ඇතුළු බිත්තියේ වැදීමෙන් හානි පැමිණීම වැළැක්වීම සඳහා යොදාගෙන ඇත්තකි.

i. කලා වැවට ගරු බුහුමන් දක්වන්නේ කවුද?
ii. ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම වාන පිහිටා ඇත්තේ කොහෙද?
iii. එය සාදා ඇත්තේ කෙසේ ද?
iv. විසල් වැවක ඇති තවත් වැදගත් අංගයක් ලියන්න.
v. එම අංගය වැවක යොදාගෙන ඇත්තේ ඇයි? (ලකුණු 2 × 5 = 10)

05. i. පහත අනතීත කාල වාක්‍යය අතීත කාලයට හරවා ලියන්න.
(අ) වෛද්‍යවරයා රෝගියා පරීක්ෂා කරයි.
(ආ) ගායිකාව ප්‍රේක්ෂකයනට ආචාර කරයි.

(ලකුණු 2 × 2 = 4)

ii. පහත සඳහන් ප්‍රකාශ කළේ කවුද, කාටද යන්න ලියන්න.
(අ) "ඔය දෙන්නා නම් පින්වත් ඇත්තෝ"
(ආ) "මේක එක කටකටත් මදිනේ"
(ඇ) "එසේ කල කෙසේ පැන් බොව්දැ"

(ලකුණු 2 × 3 = 6)

**06. පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

i. සිංහල ජනකතා ඇතුළත් කරමින් ඒ. පී. ගුණරත්න මහතා විසින් රචිත ග්‍රන්ථය කුමක් ද?
ii. "උදයසිරි" පද්‍ය පන්තියේ රචකයාගේ නම ලියන්න.
iii. කුමාරතුංග මුනිදාස මහතා විසින් ලියන ලද ළමා කෘති දෙකක් ලියන්න.
iv. ජනකවි වර්ග හතරක් ලියන්න.
v. පන්සිය පනස් ජාතක පොතේ අන්තර්ගත කතා පුවත්වලින් කියවෙන්නේ කුමන කතා පුවත් ද?

(ලකුණු 2 × 5 = 10)

සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 06 ශ්‍රේණිය - 2023
Second Term Test - Grade 06 - 2023

# සිංහල භාෂාව හා සාහිත්‍යය

## පිළිතුරු පත්‍රය

### I කොටස

01. iv    02. i    03. iv    04. ii    05. iii

06. හඳ, සඳ, තරිඳු, සොමි, සෝකර..... ආදි හඳ සඳහා වූ පර්යාය පද    07. සුදු, ස්වේත, ............

08. කාන්තාව, ගැහැනිය, ලිය ...............    09. සොම්නස    10. අනාදරය

11. ii    12. iii    13. iii    14. iii    15. i    16. ගුරුවරු    17. ගැහැනියක    18. විකුණුවා ය.

19. කළෝ ය.    20. "අම්මේ, අනික් පාර මමත් බෝට්ටුවෙන් යනවා" යි ශරත් කෑ ගැසුවේ ය.

(ලකුණු 2 × 20 = 40)

### II කොටස

01. i. (අ) ං    (ආ) ඃ ග, ජ, ඩ, ද, ඹ, ළ

ii. තරහට කෑමක් විසි    නොකරන්නේ
එළිපිට හිටගෙන කෑම    නොකන්නේ

iii. ගියාය, බැලුවාය, ගැයුවාය ආදි නිවැරදි පිළිතුරු සඳහා ලකුණු පිරිනමන්න.

iv. නලපාන ජාතකය    v. පියදාස රණරාළට

(ලකුණු 2 × 5 = 10)

02. කරුණු සඳහා    8
සංවිධානාත්මක බව, නිර්මාණශීලී බව ඇතුළුව    8
ශිල්පීය දක්ෂතා    4
මුළු ලකුණු    20

03. ආකෘතියට    2
කරුණු සඳහා    4
ශිල්පීය දක්ෂතා    4
මුළු ලකුණු    10

04. i. නුවර කලාවිය වැසියෝ    ii. කලා වැවේ    iii. කළුගල කපා / කැපීමෙන්    iv. රළපනාව

v. දිය රැලි වැවේ ඇතුළු බිත්තියේ වැදීමෙන් හානි පැමිණීම වැළැක්වීම සඳහා    (ලකුණු 2 × 5 = 10)

05. i. (අ) වෛද්‍යවරයා රෝගියා පරීක්ෂා කළේ ය.    (ආ) ගායිකාව ප්‍රේක්ෂකයන්ට ආචාර කළා ය.

(ලකුණු 2 × 2 = 04)

ii. (අ) ඉබ්බා මානකොකුන් දෙදෙනාට    (ආ) පොරමොලා ගමා හා කයිරාට
(ඇ) උදක රාක්ෂයා වඳුරු නායකයාට / මහ බෝසතාණන් වහන්සේට    (ලකුණු 2 × 3 = 06)

06. i. වටු කිරිල්ලී හා තවත් කතා    ii. එස්. මහින්ද හිමි

iii. මඟුල් කෑම, හත්පණ, හීන් සැරය

iv. පතල් කවි, කරත්ත කවි, පාරු කවි, නෙළුම් කවි ආදී ජන කවි වර්ග

v. බුදුරජාණන් වහන්සේගේ පූර්ව ජන්ම පිළිබඳ කතා    (ලකුණු 2 × 5 = 10)